**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**ගිණුම්කරණඅඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සිදු කළ මෝටර් රථ ප්‍රත්‍යාගණනය අනුව අලාභය රු.3,929,369 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | සංචිත ගිණුම් ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | මෝටර්රථ ප්‍රත්‍යාගණනය ගිණුමට බැර කළ යුතු සමුච්චිත ක්ෂය වෙන් කිරීම් රු.3,655,619 ක් වුවද,ජර්නල් සටහන් අංක 41මගින් රු.1,918,231 ක් සමුච්චිත අරමුදල් ගිණුම බැර කර තිබුණි. | -එම- | ප්‍රත්‍යාගණනය කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.7,662,087 ක් වුවද, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ එය රු.143,929,356 ක් ලෙස දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ප්‍රාග්ධන ප්‍රදාන සටහන් කිරීමට කටයුතු කරන බව | අවසාන ගිණුම් සකස් කිරීමේදී නිවැරදි අගයන් දැක්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.5,738,191 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.49,111,572 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,565,000 | 2,336,530 | 2,131,424 | 725,118 | 3,158,000 | 2,637,103 | 3,020,790 | 657,127 |
| (ii) | කුලී | 7,060,000 | 4,681,882 | 4,681,882 | 957,759 | 7,627,000 | 5,605,712 | 6,788,276 | 1,354,246 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 425,000 | 212,000 | 212,000 | 111,000 | 1,811,000 | 302,200 | 1,222,951 | 113,000 |
| (iv) | වෙනත් ආදායම් | 428,000 | 498,100 | 412,100 | 128,812 | 93,254,000 | - | 56,845,027 | 17,960,695 |
| | | 10,478,000 | 7,728,512 | 7,437,406 | 1,922,689 | 105,850,000 | 8,545,015 | 67,877,044 | 20,085,068 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට වෙළඳබලපත්‍ර ගාස්තුහිඟය රු.113,000ක් වූඅතර වර්ෂය තුළදී ඉන් රු.111,000 ක්හෙවත් සියයට 98 ක් අයකරනොතිබුණි. | පිළි ගනිමි. 2023 අප්‍රේල් වන විට ඉන් රු.3,000 ක් අයකර ගෙන ඇත. ඉතිරි රු.108,000 ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත්බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.7,000,000 ක් හා මුද්දර ගාස්තු රු.12,000,000 ක් විය. | 2022 වර්ෂයට අදාල උසාවි දඩ හා මුද්දර ගාස්තු උපලේඛන මේ වන විට සකස් කරමින් පවතින බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාකෙලිඇල්ල නැරඹුම් මධ්‍යස්ථානයට අදාල බදු ගිවිසුමේ කොන්දේසි අංක 21 ප්‍රකාරව බදු ගැණුම්කරු විසින් බදු කාල සීමාව තුල අනුගාමී මාස 03 ක කාලයකදී මුදල් නියමිත දින හෝ එදිනට පෙර නොගෙවා ඇති විටෙක ගිවිසුම අවසන් කිරීමට කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා මාස 06 ක හිඟ බදු මුදල් තිබියදීත් ගිවිසුම අවසන් කර වෙනත් පාර්ශවයකට වත්කම බදු දීමට සභාව කටයුතු කර නොතිබුණි. | පිළි ගනිමි. නිත්‍යානුකූලව මුදල් අයකර ගැනීම සඳහා 2023.05.23 බදුරලිය පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කර ඇති බව. | බදු ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ සිට ලැබිය යුතු රු.1,442,239 ක් අනුමැතියකින් තොරව ලැබිය යුතු ගිණුම්වලින් ඉවත් කර තිබුණද 2023 මැයි දක්වා ම ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | කොරෝනා තත්ත්වය හේතුවෙන් රට වසා තැබූ කාලවලට අදාලව ලැබිය යුතු මෙම ආදායම් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. 2023.05.17 සිහි කැඳවීමක්ද යවා ඇති බව. | පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ආදායම් කපා හැරීමට කටයුතු නොකළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 අප්‍රේල් 15 දින පාලින්දනුවර ප්‍රාදේශීය සභාව සංස්ථාපනයේදී හිමිව තිබූ ඉඩම්වලින් 04 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හඳුනාගෙන නොතිබුණි. | 2006.04.15 සභාව සංස්ථාපනයේදී හිමිව තිබූ ඉඩම් 04 හඳුනාගෙන නැති බව පිළි ගනිමි. මෙම ඉඩම් පිළිබඳ විස්තර ලබාදෙන ලෙස පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම්ගෙන් 2023.02.27 විමසීම් කර ඇති බව. | සභාව සත් ඉඩම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 1946 අංක 57 දරන පොදු සුසාන හා පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළයුතු වුවත්, සභාව සතු කිසිඳු සුසානභූමියක වැට මායිම් සකස් කර නොතිබුණි. | සුසානභූමි මැණුම් කර පවරා ගැනීමෙන් අනතුරුව සභාව සතු භූමියක් ලෙස පුවරුවත් ප්‍රදර්ශනය කිරිමට කටයුතු කරන බව. | ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) පාලින්දනුවර ප්‍රාදේශීය සභා පරිපාලනය යටතේ ඇති සුසානභූමි 30 ක හිමිකම සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | පිළිගනිමි. ප්‍රාදේශීය ලේකම් සතු ඉඩම් බැවින් නිර්දේශ ලබාගෙන මැණුම් කර පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සුසානභූමිවල අයිතිය සභාව විසින් කඩිනමින් පවරා ගත යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වෙල්ගම්ගොඩ මාර්ගය සංවර්ධනය කිරිමේ කොන්ත්‍රාත්තුවේ බිල් ප්‍රමාණ පත්‍රයේ අයිතම අංක 2, 2.1, 2.2, 2.3, 2.4 යටතේ මාර්ගයේ දෙපස ඉදි කරන ලද කොන්ක්‍රීට් තීරුවේ පළල අඟල් 05 ක් සහ ඝණකම අඟල් 12 ක් විය යුතු වුවත් එහි ප්‍රමාණය අඟල් 5 x4 .5 ක් පමණක් බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, මාර්ග පාදම නැවත සකස් කර නිසි පරිදි වැටි යොදන තුරු කර්මාන්තය සඳහා ගෙවීම් නොකරන බව සභාව සහතික කර තිබියදීත් 2022 ඔක්තෝබර් 14 දින ඒ සඳහා රු.30,254 ක් ගෙවා තිබුණි. | කොන්ක්‍රීට් තීරුව අවශ්‍ය ප්‍රමාණයට නොතිබුණද, 2022.12.31 දිනට බිල්පත් යැවීමට අවශ්‍ය බැවින් ඉටු කල වැඩ සඳහා ගෙවීම් වාර්තා ඉදිරිපත් කරන ලදි. සිමෙන්ති හිඟය නිසා නැවත කොන්ක්‍රීට් යෙදීමට නොහැකි විය. පාදම සඳහා PRDA ආයතනයේ වාර්තා මත ගෙවීම් කර ඇත. අඩුපාඩු නිසා අතරුඳවුම් මෙතෙක් නිදහස් කර නැති බව. | මාර්ග පාදම නියමිත ප්‍රමිතීන්ට අනුව සකස් කරවා ගත යුතුය. |
| (ආ) කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කළ යුතු මාර්ග 03 ක් නියමිත ප්‍රමිතියෙන් නොතිබූ අතර සමිති විසින් ගිවිසුම් ප්‍රකාරව ඉටු කර නොතිබූ වැඩ කොටස්වල වටිනාකම එකතුව රු.91,856 ක් විය. | මහා මාර්ග අමාත්‍යාංශය විසින් මුළු දිවයිනටම එකම ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. සභාවේ මාර්ගයට අදාල දිග, පළල ලබා දුන් පසු යාවත්කාලීන වේ. සභාවට අවශ්‍ය පරිදි වෙනස් කළ නොහැක. මාර්ග කෙලවර අඟල් 12 ක් උසට කොන්ක්‍රීට් කිරීමට හැකි සෑම තැනකම සිදු කර ඇත. මාර්ගය දෙපස ඇති ගල් හේතුවෙන් උස ප්‍රමාණය වෙනස් වේ. ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම පිළිබඳ අදාල සමිති දැන්වත් කර ඇති බව. | ගිවිසුම් හා ඇස්තමේන්තු ප්‍රකාරව මාර්ග සංවර්ධන කටයුතු සිදු කළ යුතුඅතර ගෙවීම් කිරීමේදී නිවැරදිව මිණුම් ගත කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරු තනතුරුවල පුරප්පාඩු 03 ක් පමණක් පැවතියද අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව හා බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව එවකට සිටි ලේකම් විසින් කම්කරුවන් 32 දෙනෙකු 2019 වර්ෂයේ සිට බඳවාගෙන තිබුණි. | මෙම කම්කරුවන් සභාවේ අවශ්‍ය කටයුතු සඳහා යොදවා ඇති බව. | පූර්ව අනුමැතියකින් තොරව කම්කරුවන් බඳවා ගැනීම නොකළ යුතු අතර ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කළ යුතුය. |